# පිරික්සුම් ලැයිස්තුව

ස්ථාන මාරු අයදුම්පත සමග මෙම පිරික්සුම් ලැයිස්තුව සම්පූර්ණ කර අමුණා එවීම අනිවාර්යය වේ.

**ස්ථාන මාරුවීම් යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් වෙනත් පළාත් රාජ්‍ය සේවාවන්ට/රාජ්‍ය සේවයට ස්ථාන මාරුවී යාමේදී ලබා දිය යුතු ලියවිලි**

| | අවශ්‍ය ලේඛණ | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු පිටපත් සංඛ්‍යාව | ඇමුණුම ඇත/නැත |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/91 යටතේ වන ස්ථාන මාරු අයදුම්පත | මුල් පිටපත හා ඡායා පිටපතක් | |
| 2. | බස්නාහිර පළාත් කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ 10 වන පරිශිෂ්ඨය | මුල් පිටපත | |
| 3. | විධිමත් පත්වීම් ලිපිය | සහතික කළ පිටපත් 02ක් | |
| 4. | ස්ථාන මාරුව ඉල්ලුම් කරන පළාත තුළ ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) (රාජ්‍ය සේවය සඳහා අදාළ නොවේ.) | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 5. | අන්තර් පළාත් ස්ථාන මාරුව ලබා ගැනීමෙන් පසු ස්ථාන මාරුව ලබන පළාත තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන බවට කැමැත්ත ප්‍රකාශිත ලිපිය/ දිවුරුම් ප්‍රකාශයක්) (රාජ්‍ය සේවය සඳහා අදාළ නොවේ.) | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 6. | සේවය ස්ථිර කිරීමේ ලිපිය | සහතික කළ පිටපත් 02ක් | |
| | ▪ සේවය ස්ථිර කර නොමැති නම්, අදාළ පළාත් රාජ්‍ය සේවයට අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව සනාථ කරන අධ්‍යාපන සහතිකවල විභාග කොමසාරිස් ජනරාල් විසින්/ විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී විසින් සනාථ කරන ලද පහත සඳහන් ලියවිලි<br>▪ අ.පො.ස.(සා.පෙ.) හා අ.පො.ස.(උ.පෙ.) විභාග ප්‍රතිඵල සටහන්<br>▪ උපාධි සහතිකය / විද්‍යාපීඨ සහතිකය / පුහුණු සහතිකය / ඩිප්ලෝමා සහතිකය සනාථ කිරීමේ ලිපියේ පිටපතක්<br>▪ වැඩ භාර ගැනීමේ ලිපියේ පිටපතක් | සෑම ලියවිල්ලකම සහතික කරන ලද පිටපත් 02ක් ඉදිරිපත් කළ යුතුය | |
| 7. | නිලධාරියා දැනට දරණ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල ලේඛන | සහතික කළ පිටපත් 02ක් | |
| 8. | පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධරයන් අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛණයේ අවසානයේ තැබීමේ කොන්දේසියට යටත්ව, ස්ථාන මාරු ලබන පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළකල ලිපිය/දිවුරුම් ප්‍රකාශය. ) (රාජ්‍ය සේවය සඳහා අදාළ නොවේ.) | මුල් පිටපත හා ඡායා පිටපතක් | |

| | | | |
|---|---|---|---|
| 9. | වෙනත් පළාත් රාජ්‍ය සේවයකින්/රාජ්‍ය සේවයෙන් ස්ථානමාරු මත බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පැමිණි නිලධරයෙක් නම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය | සහතික කරන ලද ඡායා පිටපතක් | |
| 10. | ස්ථාන මාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) වැටුප් රහිත නිවාඩු ඇති/නැති බවට නිවාඩු වාර්තාවක් (ආයතන ප්‍රධානී නිර්දේශ සහිතව) | මුල් පිටපත හා ඡායා පිටපතක් | |
| 11. | නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇති/ආරම්භ කිරීමට සූදානම්ව ඇති / නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී ගේ සහතිකය<br>(මෙහි විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට සූදානම්ව ඇතැයි යන්නෙන් අදහස් කෙරෙනුයේ සිද්ධියට අදාළ මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව/ඒ පිළිබඳව නිලධාරයාගෙන් නිදහසට කරුණු විමසා තිබීම යන්න වේ.) | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 12. | බස්නාහිර පළාත් සභාවේ සේවා කාලය තුළදී රජයට ඉස්නාහිර පළාත් සභාවට කිසියම් කරුණකට අදාළ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව පවතින/නොපවතින බවට ආයතන ප්‍රධානි සහතිකය. | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 13. | නිලධාරියා සම්බන්ධයෙන් වාර්තා වූ බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති /නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකය. | | |
| 14. | නිලධාරියා සම්බන්ධයෙන් වාර්තා වූ එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති /නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී සහතිකය. | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 15. | අදාළ නිලධාරියා බස්නාහිර පළාත් සභාවේ වියදමෙන් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම්, පුහුණුවට අදාළ ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත්වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයක යටත්කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී ඇති/නැති බවට ආයතන ප්‍රධානියා ගේ වාර්තාව. | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |
| 16. | නිලධරයා රජයේ හෝ බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් ඇප මත වෙනත් පාර්ශ්වයක් වෙතින් ලබා දී ඇති සහන හෝ වරප්‍රසාද හෝ ඉදිරි කාලයට අදාළ වගකීම්වලින් නිදහස් කර ඇති බවට ආයතන ප්‍රධානි විසින් නිකුත් කරන වාර්තාව (බැංකු, ණය දෙන ආයතන වලට නිලධරයා විසින් අත්සන් තබා ඇති ඇප පිළිබඳ වාර්තාව) | | |
| 17. | ස්ථාන මාරු අයදුම්කරුගෙන් බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව ස්ථානමාරු අයදුම්කරු (WPC/PSC/R/FO/02 ආකෘතියෙහි අදාළ කොටස සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.) | මුල් පිටපත හා සහතික කළ ඡායා පිටපතක් | |